# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ඇල්කඩුව වැවිලි සමාගම

# ඇබෑර්තු

ඇල්කඩුව වැවිලි සමාගමේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර : සාමාන්‍යාධිකාරී**

- **සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

  විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් වෙතින් ලබා ගත් ප්‍රථම උපාධිය සහ කළමනාකරණ පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම (මාස්ටර්ස්) හෝ කළමනාකරණ පිළිබඳ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය සමග සනාථ කළ හැකි වාර්තාවක් සමග රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ ආයතනයක ප්‍රථම උපාධි ලබා ගැනීමෙන් පසු ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවුරුදු 05 ක් ඇතුළත්ව කළමනාකරණ මට්ටමේ අවුරුදු 20 ක පළපුරුද්ද.

- **සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන්**

  ඇල්කඩුව වැවිලි සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාණ්ඩයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරක අවම වශයෙන් වසර 03 ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : Rs. 161,140/- 12 x 4,850 = 219,340/- (HM 2-1-2025)

**වැටුප** රු. 91,690 - 2,480 x 10 - 3,450 x 15 - Rs. 168,240/-

**පත්වීමේ ස්වභාවය** : ස්ථිර පත්වීමක් වන අතර, සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා හිමිකම් සහිත වේ.

**මූලික වැටුප් පියවර** : Rs. 140,317/- කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II ප්‍රකාරව

**වයස** : වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය** : පත්කිරීමේ බලධාරීන් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සිදු කෙරේ.

**ව්‍යුහමය සම්මුඛ පරීක්ෂණය**

| | |
|---|---|
| • අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| • අදාළ අමතර සුදුසුකම් | ලකුණු 30 |
| • වෙනත් ලද ජයග්‍රහණ | ලකුණු 15 |
| • සම්මුඛ පරීක්ෂණයේදී ලබන කාර්ය සාධනය | ලකුණු 25 |
| ලකුණු | 100 |

**වෙනත්** : තනතුරට අදාළ රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීමට ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් විය යුතුය.

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- විශිෂ්ඨ චරිතයක් හිමි පුද්ගලයෙකු විය යුතුය.

**අයදුම්පත් -** අයදුම්කරුවන් විසින් සියලුම විස්තර හා උප්පැන්න, අධ්‍යාපනික සහතිකවල හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සහිතව සකස් කළ අයදුම්පත්, පහත සඳහන් ලිපිනය වෙත, ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අදාළ භාරගැනීම අවසන් කරනු ලබන වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය 2026 සැප්තැම්බර් 04 වන දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**ඇල්කඩුව වැවිලි සමාගම,**
**රත්වත්ත, උකුවෙල. 066-2242518**
**දිනය : 2026 අගෝස්තු 13 වෙනිදා**